සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25B | S | I

## දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020
## Second Term Test - Grade 12 - 2020

විභාග අංකය ............................. **යුරෝපා ඉතිහාසය I** කාලය පැය තුනයි

උපදෙස්

- ♦ මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- ♦ I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

### I කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ (05) බැගින් දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. සේන් 2. ටයිබර් 3. තේම්ස් 4. කීල් 5. විස්ටියුලා (.....)

02. 1. ඊජියන් 2. අසෝව් 3. මර්මරා 4. කැස්පියන් 5. ඇපිනයින් (.....)

03. 1. මිනෝවාන් 2. රීමස් 3. ෆිනීෂියන් 4. මයිසිනියන් 5. ඩෝරියන් (.....)

04. 1. මාර්ස් 2. වීනස් 3. සියුස් 4. මිනර්වා 5. සෙරෙස් (.....)

05. 1. පෙරික්ලීස් 2. ඔගස්ටස් සීසර් 3. මාකස් අවුරේලියස් 4. නීරෝ 5. ජස්ටීනියන් (.....)

06. 1. ප්‍රජාතන්ත්‍රවාදය 2. අධිරාජ්‍යය 3. කතිපයාධිපති ආණ්ඩුව 4. රාජාණ්ඩු පාලනය 5. ප්‍රජා පීඩක පාලනය (.....)

07. 1. කොරඩෝවා 2. සෙමිලේ 3. බාසිලෝනා 4. දමස්කස් 5. පාදුවා (.....)

08. 1. තේලිස් 2. පයිතගරස් 3. රශේස් 4. ආකිමිඩීස් 5. හෙරඩෝටස් (.....)

09. 1. ඇනෙක්සිමිනිස් 2. නිකලස් කොපර්නිකස් 3. ජොහැන්නස් කෙප්ලර් 4. අයිසෙක් නිවුටන් 5. ගැලීලියෝ ගැලිලි (.....)

10. 1. දෙවන හෙන්රි 2. තුන්වන හෙන්රි 3. හතරවන හෙන්රි 4. නාවික හෙන්රි 5. අටවන හෙන්රි (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. 1. අල්හසන් - දෘෂ්ටිවාදය
2. වර්ජිල් - ඊනිඩ්
3. ඕමාර් ඛයියාම් - රුබයියාට්
4. හෝමර් - ඉලියඩ් සහ ඔඩෙසි
5. ඩිමොස්තිනීස් - ඊසෝප්ගේ උපමා කතා (.....)

12. 1. රෝමය - ටයිබර් ගංගාව
2. ලන්ඩන් - තේම්ස් ගංගාව
3. පැරිසිය - සේන් ගංගාව
4. ලිස්බන් - ටාගුස් ගංගාව
5. ජිනීවා - ඩැනියුබ් (.....)

13. 1. ඇරිස්ටෝටල් - තුලනාත්මක ආණ්ඩුක්‍රම පර්යේෂණ
2. ඔගස්ටස් සීසර් - රෝම අධිරාජ්‍යයා
3. මහා ග්‍රෙගරි - පාප් තනතුර බිහිවීම
4. නොමැන්ඩි හි විලියම් - ප්‍රංශය ජය ගැනීම
5. තුන්වන ජෝන් - මැග්නාකාර්ටා ගිවිසුම, මහා ප්‍රඥප්තිය අත්සන් කිරීම. (.....)

14. 1. බ්‍රසල්ස් - බෙල්ජියම
2. වෝර්සෝ - පෝලන්තය
3. වියානා - ඔස්ට්‍රියාව
4. පීටර්ස්බර්ග් - රුසියාව
5. හේග් - ජර්මනිය (.....)

15. 1. බර්තොලමියුඩයස් - අප්‍රිකාවේ දකුණු තුඩුවට යාත්‍රා කිරීම.
2. ෆර්නැන්ඩෝ කෝටෙස් - පැනමා දේශ සන්ධියට පැමිණීම
3. වස්කෝ ද ගාමා - ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණීම
4. ක්‍රිස්ටෝපර් කොලම්බස් - කැරිබියන් දූපත්වලට ගොඩ බැසීම
5. චෙම්බලෙන් මාක්විටේ - ක්විබෙක් ප්‍රදේශය සොයා ගැනීම. (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව , X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

| | X | | Y |
|---|---|---|---|
| 16. 1. | පෙරික්ලීස් | A | රෝම නීති ක්‍රමය |
| 2. | රොමියුලස් හා රීමස් | B | ශුද්ධ රෝම අධිරාජ තනතුර |
| 3. | ජස්ටීනියන් අධිරාජ්‍යයා | C | ග්‍රීසියේ ස්වර්ණමය යුගය |
| 4. | චාලිමේන් අධිරාජ්‍යයා | D | පළමු වන කාලිෆ් වරයා |
| 5. | අබුබකර් | E | රෝමය ගොඩ නැගීම |

1. CEABD 2. CEBAD 3. CEADB 4. EACDB 5. EADBC (.....)

17.

| X | Y |
|---|---|
| 1. මැරතන් සටන | A ඉස්ලාම් භක්තිකයන් සහ කිතුනුවන් |
| 2. පෙළපොනීසියානු යුද්ධය | B ලැන්කැන්ස්ටර් සහ යෝර්ක් |
| 3. පියුනික් යුද්ධය | C ඇතැන්ස් සහ පර්සියානු අධිරාජ්‍යයා |
| 4. රෝස යුද්ධය | D ඇතැන්ස් සහ ස්පාර්ටා |
| 5. කුරුස යුද්ධය | E රෝමය සහ කාර්තේජය |

1. DACEB 2. DABCE 3. CDEBA 4. EDABC 5. EDBAC (.....)

18.

| X | Y |
|---|---|
| 1. ඉතාලිය | A පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය |
| 2. ග්‍රීසිය | B පුනරුදය |
| 3. රෝමය | C ප්‍රොතෙස්තන්වාදය |
| 4. ජර්මනිය | D ඍජු ප්‍රජාතන්ත්‍රවාදය |
| 5. එංගලන්තය | E අධිරාජ්‍යවාදය |

1. CBDEA 2. BDECA 3.CDEAB 4. CEABD 5.CBDAE (.....)

19.

| X | Y |
|---|---|
| 1. ෆර්ඩිනන්ඩ් ඉසබෙලා යුවල | A නැන්ටීස් ආඥාව නිකුත් කිරීම. |
| 2. I එලිසබෙත් රැජිණ | B එංගලන්තය ජය ගැනීම. |
| 3. නෝමැන්තිහි විලියම් | C රාජ්‍ය පාලනයට දේවවරම්වාදය යොදා ගැනීම. |
| 4. IV වන හෙන්රි | D ස්පාඤ්ඤ අමෙඩාව පාලනය කිරීම. |
| 5. 14 වන ලුවී | E සප්ඤ්ඤය ජාතික රාජ්‍යයක් වීම |

1. EBADC 2. EDACB 3. DBEAC 4. EBCAD 5. EDBAC (.....)

20.

| X | Y |
|---|---|
| 1. සියක් අවුරුදු යුද්ධය | A පීඩ්මොන්ට් රාජ්‍යය හා ඕස්ට්‍රියාව |
| 2. ජේනා සටන | B ඕස්ට්‍රියාව හා ප්‍රශියාව |
| 3. මැජෙන්ටා සටන | C ප්‍රංශය හා එංගලන්තය |
| 4. සැඩෝවා සටන | D ප්‍රංශය සහ ඕස්ට්‍රියාව |
| 5. රිවෝලි සටන | E ප්‍රංශය හා ප්‍රශියාව |

1. CEADB 2. CEBDA 3.CEBAD 4.ECBAD 5.ACEBD (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු එක බැගින් සපයා ඇත. එම කරුණු අතරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. රෝමයේ පාලන ක්‍රමය
    1. මුල් යුගයේ රාජාණ්ඩු ක්‍රමය ක්‍රියත්මක වීම.
    2. පසුකාලීනව සමූහාණ්ඩු ක්‍රමයට පාලනය වෙනස් විය.
    3. සෙනෙට් සභාව සතුව පාලන බලතල පැවතීම.
    4. අධිරාජ්‍යය පාලනය හේතු කොටගෙන වහල්සමාජ ක්‍රමය ඇති වීම.
    5. ජූලියස් සීසර් ප්‍රථම රෝම අධිරාජ්‍යයා වීම. (.....)

22. ජාතික රාජ්‍ය බිහි වීමේ පසුබිම
    1. වැඩවසම් රදළ ප්‍රධානීන්ගේ කැරලි ගැසීම.
    2. නූතන දාර්ශනික මතවාද
    3. පුනරුදය
    4. වානිජ වාදය
    5. මධ්‍යම පන්තිය බිහි වීම (.....)

23. දේශ ගවේෂණ ව්‍යාපාරයේ ප්‍රතිඵල
    1. කාර්මික විප්ලවයට මඟ පෑදීම.
    2. ආසියා අප්‍රිකා සහ ඇමෙරිකානු මහාද්වීපවල යුරෝපා බල ව්‍යාප්තිය
    3. නව අධිරාජ්‍යවාදය
    4. ජාත්‍යන්තර වෙළඳාම සීමා වීම.
    5. යුරෝපා සංස්කෘතිය විසින් පැරණි ශිෂ්ටාචාර ආක්‍රමණය කිරීම. (.....)

24. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය බිහි වීමේ පසුබිම
    1. ජර්මනිය මුල් කරගෙන ආරම්භ වීම.
    2. කතෝලික පල්ලියේ ඉගැන්වීම්වලට එරෙහි වීම.
    3. 10 වන ලියෝ පාප් වහන්සේ මූලිකත්වය ගැනීම.
    4. ක්‍රිස්තු සභාවේ දූෂිත බඳු ප්‍රතිපත්ති
    5. ජාතික රාජ්‍ය පාලකයින් සහ ක්‍රිස්තු සභාව අතර පැවති බල අරගලය. (.....)

25. ට්‍රෙන්ට් සම්මේලනය
    1. 3 වන පාවුළු පාප්තුමා ට්‍රෙන්ට් හි දී ආරම්භ කිරීම.
    2. ශුද්ධ රෝම අධිරාජ්‍යයාට විරෝධය දැක්වීමේ ව්‍යාපාරයක් වීම.
    3. විනාශ වී ගිය කතෝලික සභාවේ ප්‍රතිරූපය නැවත ගොඩ නැංවීමේ අරමුණ.
    4. අධර්ම මර්ධනාධිකරණය නැවත පිහිටුවීම.
    5. පාප්තුමාගේ බල අධිකාරිය තහවුරු කිරීම. (.....)

- **අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A B C හා D යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

    A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
    A සහ C පමණක් නිවැරදි නම් 2 ද,
    B සහ C පමණක් නිවැරදි නම් 3 ද,
    C සහ D පමණක් නිවැරදිනම් 4 ද,
    වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදිනම් 5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය. |

26. ග්‍රීක ශිෂ්ටාචාරයේ අධ්‍යාපන ක්‍රමයේ පැවති ප්‍රධාන ලක්ෂණ සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
    (A) එක් එක් පෞර රාජ්‍යවලට ආවේණික අධ්‍යාපන ක්‍රම පැවතිණි.
    (B) පෞද්ගලික පාසල් හා ගුරුවරුන් විසින් අධ්‍යාපනය ලබා දීම.
    (C) ස්පාර්ටාවේ අධ්‍යාපන ක්‍රමය හමුදාමය ස්වරූපයක් ගැනීම.
    (D) ප්ලේටෝ හා ඇරිස්ටෝටල් ප්‍රකට ගුරුවරු වීම. (.....)

27. පැරණි රෝම ගෘහ නිර්මාණ ශිල්පය සම්බනධයෙන් කවර ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදි වේද?
   (A) පොදු ගොඩනැගිලි ඉදි කිරීම හා සනීපාරක්ෂක ගොඩනැගිලි ඉදි කිරීම කැපී පෙනෙන ලක්ෂණයක් වීම.
   (B) විශාල ගොඩනැගිලි, කේතු ආකාර වහල දක්නට ලැබීම.
   (C) කොලෝසියම් ක්‍රීඩාගාරය, බැසිලිකා ගොඩනැගිල්ල, ඩයොක්ලීෂන් අධිරාජ්‍යයාගේ මාළිගාව විශිෂ්ට නිර්මාණ වේ.
   (D) ඉදි කිරීම්වල දී වැඩි වශයෙන් දැව යොදා ගැනීම. (....)

28. 14 වන ලුවී රජු සබම්න්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශනිවැරදි වේද?
   (A) දේවවරම්වාදයට අනුව තම පාලන ප්‍රතිපත්ති පවත්වා ගෙන යෑම.
   (B) ප්‍රංශ බලය වර්ධනය කිරීමේ අරමුණින් විදේශීය යුද්ධ වලට සම්බන්ධවීම.
   (C) හියුගනෝවරුන් සමඟ ආගමික සහජීවනය පවත්වාගෙන යෑම.
   (D) ස්ටේට්ස් ජෙනරාල් සභාව කැඳවීමට කටයුතු කිරීම. (.....)

29. බ්‍රිතාන්‍යයේ ස්ටුවර්ට් රජ සමය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   (A) පාර්ලිමේන්තු ව සහ රජු සමඟ ආරවුල් පැවති සමයක් වීම.
   (B) මහා ප්‍රඥප්තිය සම්මත කර ගැනීම.
   (C) පළමු වැනි චාල්ස් රජුට එරෙහිව පාර්ලිමේන්තුව කැරලි ගැසීම.
   (D) ස්ටුවර්ට් පෙළපතට බලය රැක ගැනීමට ඔලිවර් ක්‍රොම්වෙල්ගේ සහනය හිමි වීම. (.....)

30. ඕග්ස්බර්ග් සමථය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   (A) ජර්මනියේ කතෝලික හා කැල්වින් අතර ඇති වූ ගැටුම් සමථයකට පත් කිරීම ප්‍රධාන අරමුණ විය.
   (B) ජර්මන් රාජ්‍යවල පැවතිය යුතු ආගම තීරණය කිරීමේ අයතිය පාලකයන්ට පැවරීම.
   (C) 1552 න් පසුව ප්‍රොතෙස්තන්ත්‍රවාදය වැළඳගත් පූජකවරු කතෝලික සභාවේ සිටිය දී භුක්ති විඳි ඉඩම් අයිතිය අතහැර දැමිය යුතු වීම.
   (D) ජර්මන් කුමාරවරු තව දුරටත් කතෝලික සභාවේ සහ පාප් වහන්සේගේ අධිරාජ්‍ය පිළිගත යුතු වීම. (.....)

- **ප්‍රශ්න අංක 31 - 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. රෝම අධිරාජ්‍යය නැගෙනහිර හා බටහිර රෝම අධිරාජ්‍යය ලෙස කොටස් දෙකකට බෙදී ගියේ කවර අධිරාජ්‍යයාගේ පාලන සමයේ දී ද?
   1. ඔගස්ටස් සීසර් 2. නීරෝ 3. කැරැකැල්ලා
   4. ඩයොක්ලීෂන් 5. කොන්ස්ටන්ටයින් (.....)

32. ඉස්ලාම් අධිරාජ්‍යය ගොඩ නැංවූ කාලිෆ්වරයා කවුද?
   1. අබුබකර් 2. උස්මාන් 3. ඕමාර් 4. අලි 5. මූ ආවියා (.....)

33. දේශපාලන අවශ්‍යතාව මත කතෝලික රටක් වූ ප්‍රංශය ස්පාඤ්ඤයට හා ශුද්ධ රෝම අධිරාජ්‍යයට එරෙහිව යුද වැදීමට උපදෙස් දුන් රාජ්‍ය තාන්ත්‍රිකයා කවුද?
   1. සුලීහි ආදිපාදවරයා 2. රිචලියු 3. මැසරින් 4. කෝල්බෙයාර් 5. නෙකර් (.....)

34. ක්‍රි.ව. 1649 දී එංගලන්ත පාර්ලිමේන්තුව හා රජතුමා අතර ඇති වූ අරගලයෙන් පරාජය වී හිස් ගැසුම් කෑ රජතුමා කවුද?
   1. III ජොන් 2. II එඩ්වඩ් 3. හෙන්රි 4. I ජේම්ස් 5. I චාල්ස් (.....)

35. දේශ ගවේෂණ ව්‍යාපාරය හරහා දකුණු ඇමෙරිකානුවේ පිහිටි පැරණි ශිෂ්ටාචාර විනාශ කිරීමේ අපකීර්තිය හිමිකරගත් යුරෝපා රාජ්‍ය වන්නේ කුමක්ද?
   1. ස්පාඤ්ඤය 2. පෘතුගාලය 3. ප්‍රංශය 4. බෙල්ජියම 5. එංගලන්තය (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|
| 36. පෙරික්ලීස් යුගය ග්‍රීක කලාවේ ස්වර්ණමය යුගය ලෙස සැළකේ. | ග්‍රීක කලාවේ ක්ෂේත්‍ර අතර මූර්ති ශිල්පය හා ගෘහ නිර්මාණ ශිල්පය කැපී පෙනෙයි. මානව ශරීරයේ සියලු අංග මනාව ඉස්මතු කරමින් ප්‍රතිමා නිර්මාණය කළ ඔවුහු හුණුගල් හා කිරිගරුඬ වලින් උසස් තත්වයේ ගොඩනැගිලි ඉදිකළහ. (.....) |
| 37. රෝමය අධිරාජ්‍යයක් වන විටත් සංවිධානාත්මක ආගමක් නොතිබූ අතර ස්වභාව ධර්මයේ විවිධ වස්තූන්ට වන්දනාමාන කළහ. | මාකස් අවුරේලියස් අධිරාජ්‍යයන්ගේ පාලන සමයේ දී කිතු දහම රෝමයේ නීත්‍යානුකූල ආගම බවට පත් කෙරිණි. (.....) |
| 38. ක්‍රි.ව. 11 වැනි සියවසේ සිට පැවති කුරුස යුද්ධවලින් ඉස්ලාම් භක්තිකයින් පරාජය කර සිය ආගමික පැවැත්ම ආරක්ෂා කර ගැනීමට කිතුනුවන් සමත්වීම 1453 කොන්ස්තන්තිනෝපල් නගරය යටත් වීම තුළින් සංකේතවත් කරයි. | වැඩවසම් යුගයේ දී දැකිය හැකි ප්‍රධාන දේශපාලන ලක්ෂණයක් වන්නේ රජු වටා බලය සංකේන්ද්‍රගත වී තිබීමයි. (.....) |
| 39. තුන්වන ඉනෝසන්ට් පාප්තුමා කතෝලික සභාවේ දූෂණවලට පහර ගැසීමේ වරදට ජෝන් කැල්වින් හට මරණ දඬුවම ලබා දුන්නේය. | ස්පාඤ්ඤ ජාතික ඉග්නේෂස් ලොයොලා විසින් ආධ්‍යාත්මික අභ්‍යාස නැමැති කෘතිය රචනා කරන ලදුව එය ජේසුයිට් වරුන්ගේ අත්පොත බවට පත් වූ අතර ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරයේ ප්‍රබල ජීවය විය. (.....) |
| 40. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය සැබෑ ලෙසම ආරම්භ වන්නේ 13 වන සියවසේ දී පළමු වන එඩ්වඩ් රජුගේ පාලන සමයේ දී එතෙක් එක් මණ්ඩලයක් වශයෙන් රැස් වූ පාර්ලිමේන්තුව මණ්ඩල දෙකක් ලෙස බෙදී යාම නිසා බව පිළිගැනේ. | ප්‍රංශය තුළ වැඩවසම් වාදය කොතරම් ප්‍රබලව පැවතිය ද අසහාය රාජාණ්ඩු බලය ආරක්ෂා කරගෙන සිය අභිමතය පරිදි ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල හැසිරවීමට 14 වන ලුවී රජතුමා සමත් විය. (.....) |